# 4.3.3/4.3.4( විජය නන්දසිරි සහ ශ්‍රියන්ත මෙන්ඩිස් )

## 4.3.3 විජය නන්දසිරි



**උපත:-** 1947 මැයි 06, ගල්කිස්ස,ශ්‍රී ලංකාව

**විපත:-** අගෝස්තු 8, 2016 (වයස 69)

කළුබෝවිල ශික්ෂණ රෝහලේදී

**රැකියාව:-** රංගන ශිල්පී,නිවේදක

**අධ්‍යාපනය:-** විද්‍යාකර විද්‍යාලය,මහරගම

**සම්මාන:-** සරසවිය හොඳම නළුවා, 2007 දී විකට චරිතයකට රඟපෑ හොඳම නළුවා ලෙස ප්‍රථම වරට සම්මාන ලබා ගැනීය.

**ජීවන තොරතුරු;-** ඉලුක්පිටිය මුදියාන්සේලාගේ විජය නන්දසිරි ශ්‍රී ලාංකික නළුවෙකු, නිවේදකයෙකු, ගායකයෙකු වෙයි. විදුර දිව නාට්‍යයෙන් කලා දිවිය ඇරඹූ ඔහු මනමේ, සිංහබාහු, කුවේනි, රත්නාවලී වැනි වේදිකා නාට්‍යයන්හි රංගනයෙන් දායක වූයේය. මාතර ආච්චි චිත්‍රපටයෙන් සිනමාවට පැමිණි ඔහු නෑදෑයෝ සිනමාපටයෙන් සිනමා නළුවෙකු ලෙස සිනමාවට අවතීර්ණ විය.

නන්දසිරි මහතා වේදිකාවට, සිනමාවට මෙන්ම රූපවාහිනියටද තම දක්ෂතා ඉදිරිපත් කළේය. නෝනාවරුනි මහත්වරුනි, යර්ස් බොස්, එතුමා, මෙතුමා ටෙලිනාට්‍යන්හි හාස්‍ය උත්පෝදක චරිතයක් වූයේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු සිකුරු හතේ, සුහද කොකා වැනි විකට චිත්‍රපට ඔස්සේ ප්‍රහසන රංගන ශිල්පියකු ලෙස ප්‍රේක්ෂකයන් අතර ඉමහත් ජනප්‍රියත්වයට පත්විය.

❖ **නාට්‍ය කලාවේ දායකත්වය:-**

- 1966 දී නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසියේ ය.
- රංගන ශිල්පියෙකු ලෙස වඩාත් ප්‍රකට වේ. නාට්‍ය අධ්‍යක්ෂණයේ ද යෙදේ.
- නාට්‍ය, සිනමා හා ටෙලි නාට්‍ය යන මාධ්‍ය තුනෙහි ම කැපී පෙනෙන රංගන ශිල්පියෙකි.
- ඔහු වඩාත් ප්‍රකට ව ඇත්තේ හාස්‍ය රංගනය සඳහා ය.

❖ **රංගන දායකත්වය**

- මනමේ,
- සිංහබාහු,
- කුස පබාවතී (රංගනය, අධ්‍යක්ෂණය),
- රත්නාවලී,
  රංකඳ,
- විශ්ව සුන්දරී,
- සුභ සහ යස,
- තාරාවෝ ඉගිළෙති,
- ඒකාධිපති,
  කුවේණි,
- හුණුවටයේ කතාව,

- වහලක් නැති ගෙයක්
  සහ මෑත කාලයේ ඉතා ජනප්‍රිය නාට්‍ය කිහිපයකට ඇතුළු වේදිකා නාට්‍ය 40කට වැඩි සංඛ්‍යාවකට රංගනයෙන් දායකත්වය සපයා ඇත.

❖ **සිනමාවට රංගන දායකත්වය**

- යස ඉසුරු,
- නෑදෑයෝ,
- රේල්පාර,
- සසර,
- සඳකඩ පහණ,
- කිං හන්තර්,
- බංගලි වලලු

❖ **ඔහුගේ හාස්‍ය රංගන දායකත්වය**

- සිකුරු හතේ
- සර් ලාස්ට් චාන්ස්
- මගෝ ඩිගෝ ඩයි
- කෝ මාර්ක් නෝ මාර්ක්
- සුහද කොකා

ඔහු රඟපෑ චිත්‍රපට අතර වේ.

❖ **ඔහුගේ රූපවාහිනී වැඩසටහන් දායකත්වය**

- "පුංචි පහේ මං"

සිකුරු හතේ සිනමා නිර්මාණය



මනමේ නාට්‍යයේ මනමේ කුමරා ලෙස,



විජය නන්දසිරි කලා ලොවට ඇතුලු වූයේ වේදිකාවෙනි. කලා ලෝකයේ විකට චරිත රගමින් වේදිකාව, රූපවාහිනිය හා සිනමාව යන අංශ තුනේ ඉතා විශිෂ්ට දක්ෂතා දැක් වූ සොඳුරු කලා කරුවෙකු ලෙස ප්‍රේක්ෂක හද තුල සදාතනික මතකයේ රැඳුනු අද්විතීය රංගන ශිල්පියෙකි.

# 4.3.4 ශ්‍රියන්ත මෙන්ඩිස්



**උපත:-** ඔක්තොම්බර් 25, ශ්‍රී ලංකාව

**රැකියාව:-** රංගන ශිල්පී , අධ්‍යක්ෂ

**අධ්‍යාපනය:-** කන්දනා ද මැසෙනොඩ් විද්‍යාලය

**සම්මාන:-** ශ්‍රියන්ත_ මෙන්ඩිස්ට දේශීය සම්මාන උළෙලවලදී අවස්ථා කිහිපයකදීම හොඳම නළුවා සහ හොඳම සහය නළුවාට හිමි සම්මාන ලැබී තිබේ.


**ජීවන තොරතුරු:** මෙන්ඩිස් ඔක්තෝම්බර් 25 වන දින රාගමා හි උපත ලැබුවේ සහෝදර සහෝදරියන් තිදෙනෙකු සිටින පවුලේ වැඩිමලා ලෙසය. ඔහු අධ්‍යාපනය අවසන් කළේ කන්දනා ද මැසෙනොඩ් විද්‍යාලයෙන්. ඔහු පාසල් කාලයේ කිසිදු සෞන්දර්යාත්මක කටයුත්තකට සහභාගී නොවීය. ඔහු පාසල් කාලයේ කරාතේ ක්‍රීඩාවේ දක්ෂයෙකි. ඔහු පොල්ගහවෙල ශාන්ත බර්නාඩෙට් විද්‍යාලයේ විද්‍යා ගුරුවරයෙකු විය. පසුව ඔහු දිවයින පුරා පාසල් කිහිපයක ගුරුවරයෙකු ලෙස වසර 32 ක් සම්පූර්ණ කළේය.

**විවාහ ජීවිතය:-** මෙන්ඩිස් විවාහ වී සිටින්නේ කුසුම් රේණු සමඟ වන අතර ඇය සිංහල සිනමාවේ, වේදිකාවේ සහ රූපවාහිනියේ කීර්තිමත් නිළියකි.

**නාට්‍ය කලාවේ දායකත්වය:-**

▪ 1978 මහාචාර්ය නෝබට් ජේ. මයර් නම් විදේශීය නාට්‍යකරුවාගේ නාට්‍ය වැඩමුළුවේ ඉදිරිපත් වූ අනේ අබිලික් නාට්‍යයේ රඟපෑමෙන් ක්ෂේත්‍රයට පිවිසියේ ය.

## රංගන දායකත්වය:-






- මෝරා,
- මහාසාර,
- එවබලව,
- මගුල් ප්‍රස්තාව,
- ඒකට මට හිනා හිනා,
- අත්,
- ඔත්තුකාරයා,
- යක්ෂාගමනය,
- තලමල පිපිලා,
- පුත්‍ර සමාගම,
- දෝන කතරිනා,
- පරාස්ස,
- දුන්යාගේ ගීතය,
- රඟපෑම් ඉවරයි,
- මහාසමයම,
- රෝමය ගිනි ගනී

යනාදී නාට්‍යවල රඟපා ඇති අතර ,නාට්‍ය රංගනය සහ අධ්‍යක්ෂණය යන කරුණු දෙකෙහි ම නිරත වේ.

❖ **සිනමාවට රංගන දායකත්වය**



- ගිනි අවි සහ ගිනි කෙලි
- පුංචි සුරංගනාවි
- ඔබර වළල්ල
- අබා
- ඇහැලේපොල කුමාරිහාමි
- සිරිපැරකුම්
- කොස්තාපල් පුඤ්චිහේ
- අනගාරික ධර්මපාල
- මහරජ ගැමුණු

ආදී.... විශාල සිනමා නිර්මාණ රාශියකට රංගනයෙන් දායක වී ඇත.

❖ **ඔහුගේ රූපවාහිනි ටෙලි නාට්‍ය දායකත්වය**



- පළඟු මැණිකේ
- බැද්දේ ගෙදර
- සුද්දිලාගේ කතාව
- මොනරතැන්න

ඔහු විසින් රංගනයේ යෙදුනු විශාල ටෙලි නාට්‍ය ගොන්නෙන් ටෙලි නාට්‍ය කිහිපයකි මේ.

රංගන ශිල්පියෙක් ලෙස ඔහු වේදිකා නාට්‍යවලට අමතර ව රූපවාහිනී නාට්‍ය සහ
සිනමා රංගනයෙන් ද දක්ෂතා ප්‍රකට කර ඇත.

**එම දක්ෂතා ඇගයීම වෙනුවෙන් ඔහු ලද සම්මාන කිහිපයක් පහත දැක්වේ.**

## Youth Services Youth Drama Festival

| Year | Nominee / work | Award | Result |
|---|---|---|---|
| 1981 | *Numba Witharak Thala Elalui* [4] | Best Actor | Won |

## State Drama Festival

| Year | Nominee / work | Award | Result |
|---|---|---|---|
| 1988 | *Mora* | Best Actor | Won |

## Sumathi Awards

| Year | Nominee / work | Award | Result |
|---|---|---|---|
| 1999 | Peoples'vote | Most popular Actor [87] | Won |
| 2001 | *Sanda Amawakai* | Best Actor [88] | Won |
| 2009 | *Sathgunakaraya* | Best Actor [89] | Won |
| 2010 | *Sadisi Tharanaya* | Best Actor [90] | Won |
| 2016 | *Vishnu Sankranthiya* | Best Actor [91] | Won |

## Presidential Film Awards

| Year | Nominee / work | Award | Result |
|---|---|---|---|
| 2006 | *Bherunda Pakshiya* | Best Actor [92] | Won |

## Raigam Tele'es

| Year | Nominee / work | Award | Result |
|---|---|---|---|
| 2007 | Peoples' vote | Most Popular Actor [93] | Won |
| 2013 | *Dhawala Kadulla* | Best Actor [94] | Won |

## SIGNIS Salutation Awards Ceremony

| Year | Nominee / work | Award | Result |
|---|---|---|---|
| 2010 | *Bambara Walalla* | Best Supporting Actor [95] | Won |

## Television State Awards

| Year | Nominee / work | Award | Result |
|---|---|---|---|
| 2013 | *Dhawala Kadulla* | Best Actor [96][97] | Won |